


විදුදය
භාෂා, සාහිත්‍ය, සංස්කෘතික හා මාධ්‍ය අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

VIDUDAYA
Journal of Language, Literary, Cultural and Media Studies
Department of Sinhala and Mass Communication, University of Sri Jayewardenepura

2024, 03 (02): 23-34

ISSN: 3051-5424

Journal homepage: https://journals.sjp.ac.lk/index.php/vidudaya

# තොටගමුව පුරාණ රජමහා විහාරයː චිත්‍ර හා මූර්ති පිළිබඳ අධ්‍යයනයක්

පදියතලාවේ අමරවංශ හිමි

සිංහල අධ්‍යයන අංශය
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
padiyathalaweamarawansa933@gmail.com

## Abstract

Thotagamuwa Rajamaha Viharaya is located in the village of Thelwatta, Wellabadapattu, Galle District. It is believed that its origins date back to the Anuradhapura period. Ruined stone pillars can be observed. There are two Buddhist temples in this temple. One Vihara is called the old Vihara. The other Vihara is called the new Vihara. Thotagamuwe Temple is most famous for the venerable Rahula Thero who resided there. In addition, this temple is also famous for its paintings and statues from the Kandyan period. The eignifirance of the temple has also increased due to the statue of the Ananga deva, which is not found in any other temple in Sri Lanka. The aim of the research is to study the paintings and statues of the Thotagamuwa Rajamaha Viharaya, which are full of such values. The observation method was used to conduct the research and collect data. In addition, the interview method was utilized, and primary and secondary sources were inlargorated. Qualitative analysis was used for data analysis. In addition, thematic and image analysis methods were also used. As a result of the research, it was possible to identify the painting tradition of the temple, the culture of the Kandyan period, the identities of Buddhist culture, and the changes in Sinhala culture during the British rule. In addition to this, it was also possible to uncover how the clothing, food, housing, household items, weapons, etc. used by the British have been incorporated into Sinhala culture. In addition to using local raw materials to create the colors needed for paintings, there were also instances of using colors imported from Western countries. The paintings have succeeded in presenting human figures, animal figures, houses, etc. in a natural manner. More Bodhisattva statues and Buddha statues can be seen in this temple than in other temples.

**Keywords:** Thotagamuwa, Viharaya, Paintings, Statues, Ananga deva

## 1. හැඳින්වීම

ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, තෙල්වත්ත ග්‍රාමයේ, තොටගමුව පුරාණ රජමහා විහාරය පිහිටා තිබේ. විහාරයට යාමට නම් ගාල්ල නගරයේ සිට කොළඹ දෙසට ගමන් කරන ප්‍රධාන මාර්ගයේ කිලෝමීටර දොළහක් පමණ ගොස් දකුණට හැරී තොටගමුව විහාර මාවතේ මීටර් පන්සියයක් පමණ යා යුතුය. තෙල්වත්ත විහාරය, තොටගමු විහාරය, රන්පත් විහාරය, පාතතොටගමු විහාරය, පුරාණ තොටගමු රජමහා රන්පත් විහාරය යන නම්වලින්ද මේ විහාරය හඳුන්වයි. දේවානම්පියතිස්ස රජතුමාගේ කාලය දක්වා මේ විහාරයේ ඉතිහාසය විහිද යයි. මහානාග රජතුමා විසින් මේ විහාරය ආරම්භ කරන ලද්දේ යැයි පැවසේ (මහින්ද හිමි, 2007:68). කැලණිතිස්ස රජතුමාත් රුහුණ රාජ්‍ය කරන සමයේ විහාරයට දිසා පිළිමය නමින් පිළිමයක් පූජා කළ බව ගිරා සංදේශයේ දෙසිය විසි නව වැනි (229) පද්‍යයේ සඳහන් වේ (ප්‍රේමරත්න, 2013:54). තුන්වන විජයබාහු රජතුමාද විහාරස්ථානයට අනුග්‍රහ දක්වා ඇත. කාලයාගේ ඇවෑමෙන් අභාවයට ගිය මේ විහාරස්ථානය නැවතත් ප්‍රතිසංස්කරණය කර ඇත්තේ ධම්මදින්න නමැති තෙරකෙනෙකුගේ ශිෂ්‍යයකු වූ පල්ලත්තර පුස්ස්සාර හිමියන් විසින් යැයි සඳහන් වේ (මහින්ද හිමි, 2017: 69). තොටගමු විහාරය ඓතිහාසික වශයෙන් වැදගත් විහාරස්ථානයකි. එහෙත් මේ විහාරස්ථානය ලංකාවේ මෙන්ම විදේශයන්හි පවා ප්‍රසිද්ධ වී ඇත්තේ ෂඩ් භාෂා පරමේශ්වර තොටගමුවේ රාහුල නම් ශ්‍රේෂ්ඨ පඬිරුවන වැඩසිටි විහාරස්ථානය ලෙසයි. උන්වහන්සේ ග්‍රන්ථ රචකයෙකු, බහුශ්‍රැත පඬිවරයකු හා සංඝරාජවරයකු ලෙස ප්‍රසිද්ධියට පත්වී ඇත. තොටගමුව විජයබා පිරිවෙන් අධිපතිවරයා වශයෙන්ද කටයුතු කොට තිබේ. මේ පිරිවෙනෙහි පැවැති ධර්ම ශාස්ත්‍රීය සේවය පිළිබඳව ගිරා සංදේශයේ පද්‍ය දහයකින් විස්තර කර ඇත. රාහුල හිමියන් සතු විශිෂ්ට ධර්මඥානයත්, පිරිවෙනේ වැඩසිටිය භික්ෂූන් වහන්සේලාගේ විනයත්, තුන්පිටකය මෙන්ම ලෞකික ශාස්ත්‍රය ඉගැන්වූ බවත් මේ සංදේශයේ තොරතුරුවලින් හෙළි වේ.

තොටගමුවේ රාහුල මහ තෙරුන් වහන්සේ සම්බන්ධයෙන් ජනප්‍රවාද රාශියක් මේ විහාරය අවට ගම්වලින් අසන්නට ලැබේ. ඒවා කිහිපයක් මෙහි සඳහන් කළ හැකිය. රාහුල සංඝරාජයන් වහන්සේ හයවන පරාක්‍රමබාහු රජතුමා ඇසුරේ හැදුණු වැඩුණු බවත්, රජතුමාටත් ඔහුගේ දරුවන්ටත් ශාස්ත්‍රීය හා ධර්ම අනුග්‍රහ දැක්වූ බවත් රචනා කර ඇති සැළලිහිණි සංදේශය හා කාව්‍යශේඛරය කෘතිවලින් හඳුනාගත හැකිය. විහාරස්ථානයේ වැඩ සිටි රාහුල තෙරුන් වහන්සේ රජතුමා හමුවීමට යන අවස්ථාවලදී තමන්ගේ වාහනය බවට පත් කරගෙන ඇත්තේ දෝලාවකි. එය ගෙනයාමට යක්ෂයන් හතර දෙනෙක් මන්ත්‍ර බලයෙන් යොදාගෙන තිබේ. දිනක් උන්වහන්සේ රජතුමා හමුවීමට කෝට්ටේ අගනගරයට ගොස් නැවතත් විහාරයට පැමිණෙන අවස්ථාවක බොහෝ වෙහෙසට පත්වී සිටියහ. දෝලාවේම ටිකක් සැතපෙන්න තීරණය කොටැ යක්ෂයන් අමතා 'මම ටිකක් නිදා ගන්නවා. දෝලාව තොටගමුවට අරගෙන යව' යි අණ කර නිදාගන්නට වූහ. මේ යක්ෂයන් සිවු දෙනා 'තොට ගමු' යන අර්ථය ගෙන ඇත්තේ 'තොපගේ ගම' යන අදහසිනි. ඒ අනුව යක්ෂයන්ගේ පුරවරයට මේ දෝලාව රැගෙන ගිය බවත්, යක්ෂයන්ගේ හඬ අසා බියට පත්වී, සොයා බලන විට යක්ෂ පුරයේ සිටින බව අවබෝධවී නැවතත් යක්ෂයන් අමතා 'වහා දෝලාව මම ගමුවට අරගෙන යව'යි අණ කර විහාරයට පැමිණි බවටද ප්‍රවාදයක සඳහන් වෙයි. මෙයින් පෙනෙන්නේ තෙරුන් වහන්සේ සතුව ඉතා ප්‍රබල මන්ත්‍ර බලයක් පැවැති බවකි (දේවරක්ඛිත හිමි, 1975:38-39). රාහුල තෙරුන් වහන්සේට ප්‍රබල මතක ශක්තියක් පැවැති බවත්, සරස්වතී නමැති තෛලයක් ඒ සඳහා භාවිත කළ බවත් තවත් ජනප්‍රවාදයක සඳහන්ය. ඒ බව ප්‍රකට කරන කථා පුවතක්ද තිබේ. භක්ති ශතකය හෙවත් බෞද්ධ ශතකය නමැති සංස්කෘත ශතක ග්‍රන්ථය රචනා කොට ඇත්තේ චන්ද්‍රභාරතී නම් පඬිවරයාය. මොහු රාහුල තෙරුන් වහන්සේගේ විදේශ ශිෂ්‍යයෙකි. හෙතෙම ශිල්ප ඉගෙනගෙන ඉන්දියාවට ගොස් උගත් ශාස්ත්‍ර උපයෝගී කරගෙන 'භක්ති ශතකය' නම් කෘතිය රචනා කර එය පළමුවෙන්ම පිළිගැන්විය යුත්තේ තමන්ගේ ගුරුවරයාට යැයි තීරණය කොට තොටගමු විහාරයට පැමිණ තිබේ. ඔහු පැමිණ තිබුණේ ගුරු පඬුරු වශයෙන් කෘතිය පිළිගැන්වීමට වඩා තමන්ගේ පාණ්ඩිත්‍ය ප්‍රදර්ශනය කිරීමටය. මේ බව වටහාගත් තොටගමුවේ රාහුල හිමි තමන්ගේ ගුරුදේවයන්වූ වීදාගම මෛත්‍රිය මහ තෙරුන්ට පවසා ඇත්තේ ආවාසය ඉදිරිපිට සිට ඔහු

ලවා කෘතිය කියවීමට සලස්වන ලෙසයි. බමුණා එය කියද්දී තොටගමුවේ රාහුල හිමි ආවාසය ඇතුළේ සිට එය වහා පිටපත් කරන්නට විය. බමුණා කෘතිය කියවා අවසන් වූ පසු රාහුල තෙරුන් අමතා 'රාහුල මේ වගේ පොතක් පුස්තකාලයේ තියෙනවා. තවම ඒක කළු මැදලත් නෑ. අරගෙන එන්න'යි පවසා තිබේ. චන්ද්‍රභාරතී එම පොත දැකලා විස්මයට පත්වූ බවත්, තමන් ලියන ලද පොතේ මෙවැනි පිටපතක් ලෝකයේ වෙනත් කිසිම තැනක තිබිය නොහැකි බවත් පවසා තිබේ. මේ ජනප්‍රවාදයෙන් පෙනෙන්නේ රාහුල හිමියන් සතු ධාරණ ශක්තියේ මහිමයයි; ලේඛන කලාවේ සහජ දක්ෂතාවයි. රාහුල තෙරුන් කෙරෙහි පහදින චන්ද්‍රභාරතී බමුණා උන්වහන්සේට ගුරු පඬුරු වශයෙන් රත්රන් ගුලියක් දුන් බවටද ප්‍රවාදයක සඳහන් වේ. පුංචි රාහුල හාමුදුරුවෝ පන්සල් මිදුලේ තිබුණු ගොම ගොඩක් දැය එය අස්කරන්නට 'සුරදෝතා' නම් කොලුගැටයකුට 'සුර දෝතා-වර මැතා, ගොම දෝතා-දම ඇතා' යනුවෙන් පැවසූ බවද ජනප්‍රවාදයේ සඳහන්ය. (දිසානායක, 1988: 39). තොටගමුවේ විහාරය අවට ගම්වලට නම් ලැබී ඇත්තේද විහාරය සමඟ පැවැති සබඳතා නිසා බවද ප්‍රවාදවල පවතියි. විහාරයට තෙල් සැපයූ ගම තෙල්වත්ත වූ බවත්, සීනි සැපයූ ගම සීනිගම වූ බවත්, බත් සැපයූ ගම බද්දේගම වූ බවත්, පෙරහන්කඩ සැපයූ ගම පැරැලිය වූ බවත්, මී ඉටි සැපයූ ගම මීටියාගොඩ වූ බවත්, විහාරයට අවශ්‍ය බට පැලලි සැපයූ ගම බටපොල වූ බවත්, පිරිවෙණට සම්බන්ධ බමුණන් නැවතී සිටි ගම බ්‍රාහ්මණවත්ත වූ බවත් පැවසේ (දිසානායක, 1988: 47).

## 2. ක්‍රමවේදය

ප්‍රත්‍යෙක අධ්‍යයනය පර්යේෂණයට අවශ්‍ය දත්ත සපයා ගැනීමට අනුගමනය කළ මූලිකම ක්‍රමවේදයයි. පර්යේෂණය සාර්ථක කර ගැනීමටත්, විහාරයේ ඓතිහාසික තොරතුරු අධ්‍යයනය කිරීමටත්, සිතුවම් සංකල්ප හා මූර්ති පිළිබඳ අවබෝධය ලබා ගැනීම වෙනුවෙනුත්, ලබා ගත් දත්ත මනාව සුපරීක්ෂා කිරීමටත්, ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය කරන ලදි. කලා මාධ්‍ය යටතට සිතුවම් හා මූර්ති නිර්මාණ අයත් වන බැවින් දත්ත විශ්ලේෂණයේදී එක් ක්‍රමයකට පමණක් සීමා නොවී පර්යේෂණයේ සාර්ථකත්වය සඳහා තේමා විශ්ලේෂණය, රූපාර්ථ විශ්ලේෂණය, නිරීක්ෂණය හා සම්මුඛ සාකච්ඡා ගුණාත්මක එළඹුමකින් යොදා ගන්නා ලදි.

## 3. සාකච්ඡාව

තොටගමු විහාරයේ බිතු සිතුවම් සහ මූර්ති ස්ථාන දෙකක දැකගත හැකිය. එක් ස්ථානයක් වන්නේ පරණ විහාරයයි. දෙවන ස්ථානය වන්නේ අලුත් විහාරයයි. මේ විහාරවල දක්නට ලැබෙන්නේ මහනුවර යුගයේ පහත රට චිත්‍ර සම්ප්‍රදායට අයත් සිතුවම්ය. ක්‍රි.ව. 1886 ඉදිවූ අලුත් විහාරයේ සිතුවම් ඇඳ ඇත්තේ හත්කෝරළයේ සිත්තර මුහන්දිරම් නමැත්තෙකි (චාර්ල්ස්, 2001:55). විහාර දෙකෙහි සිතුවම් අතර වෙනස්කම් දක්නට ලැබේ. කතළුව පූර්වාරාමය, මිරිස්ස සමුද්‍රගිරි විහාරය ආදිය මෙන් තොටගමුව පුරාණ රජමහා විහාරයේ සිතුවම්ද මහනුවර යුගයේ පහත රට සිතුවම් සම්ප්‍රදාය නිරූපණය කරයි.

### 3.1. පරණ විහාරය

පරණ විහාරය, ඇතුළු මාලය හා පිටත මාලය යනුවෙන් මාල දෙකකින් යුක්තය. මේ විහාරයට ප්‍රවේශ වීමට නැගෙනහිරින් සහ දකුණින් දොරටු දෙකක් තිබේ. තවද විහාර ගොඩනැගිල්ල චතුරශ්‍රාකාර හැඩයකින් යුක්තය. ඉදිකර ඇත්තේ ක්‍රි.ව. 1779දීය (නාගොඩවිතාන, 2019:44). ඇතුළු ගෘහයට ප්‍රවේශ වීමට ප්‍රවේශ ද්වාර දෙකක් තිබේ. ඊට ඉහළින් බිත්තියේ මතු කර ගත් මූර්තියක් ලෙස මකර තොරණ දෙකක් දක්නට ඇත. ඒවා බොහෝ

සෙයින් දුර්වර්ණ වී ගොස්ය. ඇතැම් තැනක ඉරිතලා තිබේ. පිටත මාලයේ නැගෙනහිර බිත්තියේ සස ජාතකය, දේවධර්ම ජාතකය, මාර පරාජය හා විෂ්ණු දෙවියන්ගේ සිතුවම් දක්නට ලැබේ.

### 3.1.1. ගර්භ ගෘහය

පිටත මාලයේ සිටත් නැගෙනහිර ද්වාරයෙනුත් ඇතුළු මාලයට හෙවත් පිළිම ගෘහයට ප්‍රවේශ විය හැකිය. පිළිම ගෘහය මීටර් හතක් පමණ දිගින් යුක්තය. විහාරය පිරී යන සේ දකුණු ඇලයෙන් සැතපෙන බුදුපිළිමයකි. එය ඉදිකර ඇත්තේ මණ්ඩපයක් මතයි. සිවුරේ රැලි ආදිය මහනුවර යුගයේ චිත්‍ර ලක්ෂණ මතු කරයි. සැතපෙන පිළිමයේ පාද දිසාවෙන් හෙවත් වම් පැත්තෙන් මීටර් තුනක් පමණ උස හිටි බුද්ධ ප්‍රතිමාවක්ද ශීර්ෂය දෙසින් මීටර් දෙකක් පමණ උස හිඳි සමාධි බුද්ධ ප්‍රතිමාවක්ද නිර්මාණය කර තිබේ. මේ විහාරයේ බුද්ධ ප්‍රතිමාවල විශේෂත්වය වන්නේ හැම ප්‍රතිමාවකම ශීර්ෂයේ සිරස්පතක් දැක ගත හැකිවීමයි. මෙයට අමතරව මහනුවර යුගයේ ලක්ෂණ ප්‍රකට කරන විවෘත දෙනෙත්, දක්ෂිණාවර්තී හිස කෙස් ආදී ලක්ෂණ දක්නට ලැබේ. ශ්‍රීපාදය සමීපයේ ඇති හිටි බුද්ධ ප්‍රතිමාව නැගෙනහිර බිත්තියට බද්ධ කර ඉදිකර තිබේ. එහි උස මීටර් තුනක් පමණ වේ. බදාමයෙන් මතු කොට ගත් රුස් වළල්ලක්ද දකුණතින් අභය මුද්‍රාවද වමතින් කටක හස්ත මුද්‍රාවද නිරූපණය කොට ඇත. ශීර්ෂය දෙසින් පිහිටි හිඳි සමාධි බුද්ධ ප්‍රතිමාවට නමස්කාර කරන ශ්‍රාවක රූප පහක් දකුණු දිග බිත්තියේ කෙළවරේ සිතුවම් කොට තිබේ. මේ සමාධි පිළිමයේ විශේෂත්වය වන්නේ මුහුණේ නිකට වඩාත් මතු කොට පෙන්වීමයි. මේ පිළිමයට පිටුපසින් පසුකාලීනව එකතු කළා යැයි විශ්වාස කළ හැකි ජනේලයක් ඇත. එම නිසා පැරණි සිතුවම් එම බිත්ති කොටසින් ඉවත් වී තිබේ. සමාධි පිළිමයේ ෂඩ්වර්ණ රශ්මි මාලාව පිළිමයට පිටුපස බිත්තියේ සිතුවම් කොට ඇත. සැතපෙන පිළිමයට පිටුපස බිත්තියේ සූවිසි විවරණය සිතුවම් කොට තිබේ. එම බුද්ධ රූපවලත් දෙනෙත් විවෘතව තබා ඇත. සූවිසි විවරණ සිතුවම්වලට පහළින් සැතපෙන බුද්ධ ප්‍රතිමාවට නමස්කාර කරමින් සිටින ඉරියවුවෙන් නිර්මිත ශ්‍රාවක රූප සමූහයක් චිත්‍රණය කොට තිබේ. මෙම සිතුවම්වල දෙඅත් සහ බෙල්ල ආදියද සිතුවම් කර ඇත්තේ මහනුවර යුගයේ චිත්‍ර සම්ප්‍රදායේ ලක්ෂණවලට අනුවයි. පැති පෙනුම සිතුවම් ඇඳීමේදී භාවිත කොට තිබේ. විහාරයේ තවත් විශේෂත්වයක් වන්නේ සිවිලිම පුරා ලෑලි මත නෙළුම් මල් මෝස්තර රටා සහිත වියන් සිතුවම් දක්නට ලැබීමයි. විහාරයේ සිතුවම්වලට බහුලව භාවිත කර ඇත්තේ රතු සහ කහ වර්ණයයි. ඇතුළු මාලයේ බිත්තිවල හැම අවකාශයකම ශ්‍රාවක රූප සහ ජාතක කථා පුවත් ආදි සිතුවම්වලින් හෝ මල් මෝස්තර, ලියපත් මෝස්තර, ලියවැල් රටා, වැටකේ මල, ශෛලීගත නෙළුම්මල ආදි සැරසිලි හෝ දැක ගත හැකිය. හිස් අවකාශ කොතැනකවත් දක්නට නැත. පිටත මාලයේ සිට ඇතුළු මාලයට පිවිසීමට දොරටු දෙකක් ඇත. ඒ දොරටුවලට ඉහළින් බිත්තියෙන් මතු කොට ගත් සරල මකර තොරණ දෙකකි. මකර තොරණට දෙපසින් සිංහ රූප දෙකක් හා එයට පිටතින් දොරටුපාල රූප දෙකක් දක්නට ලැබේ. පිටත මාලයේ සෙසු බිත්තිවල ජාතක කථා, මාර පරාජය, ආභරණවලින් සැරසී සිටින ප්‍රභුවරුන්ගේ සිතුවම්, මල් අතින් ගෙන පෙරහැරේ යන ප්‍රභුවරුන්ගේ රූප, දේවධර්ම ජාතකය-සස ජාතකය සිතුවමට නඟා තිබේ. සස ජාතක කථාව සිතුවමට නඟා ඇත්තේ ඉතා පහසුවෙන් අවබෝධ වන ආකාරයෙන්ය. මෙය පරණ විහාරයේ කැපී පෙනෙන ජාතක කථා පුවතකි.

### 3.2. අලුත් විහාරය

පරණ විහාරයට දකුණු දිශාවෙන් බටහිරින් මහල් දෙකක් මෙන් පෙනෙන පරිද්දෙන් අලුත් විහාරය ඉදිකොට තිබේ. ක්‍රි.ව. 1886දී මේ විහාරය ඉදි කළ බවට සාක්ෂියක් විහාරයේ ඇතුළු ගෙයි නැගෙනහිර ප්‍රවේශ දොරටුවේ උළුවස්සේ සඳහන් කර තිබේ. විහාරයේ දිග ප්‍රමාණය මීටර් දාහතක් තරම් විශාලත්වයකින් යුක්තය. ගර්භ ගෘහය, අන්තරාලය සහ සිවුදිශාවම නියෝජනය කරන බාහිර මණ්ඩපය ලෙස කොටස් තුනක් වන සේ පිළිම ගෙය

නිර්මාණය කොට තිබේ. ගර්භ ගෘහයේ විශාල බුද්ධ ප්‍රතිමා වහන්සේලා නිර්මාණය කර තිබේ. අන්තරාලය වෙන් වී ඇත්තේ සිතුවම් හා මකර තොරණ මෙන්ම වෙනත් ප්‍රතිමා මතු කිරීමටය. ඒවා බිත්තිවලින්ම මතු කොට ඇති අතර අන්තරාලයේ ඉඩ අරගෙන නැත. සිවු දිශාව නියෝජනය කරන මණ්ඩපය සැදැහැවතුන් විශාල වශයෙන් එකතු වන අවස්ථාවල රැඳී සිටීමටත්, ගර්භ ගෘහයට හා අන්තරාලය ගෘහයට වැස්සෙන්-කෘමි සතුන්ගෙන්, දූවිලිවලින් හානි වීම වැළැක්වීමටත් ආරක්ෂක විධියක් ලෙස බාහිර මණ්ඩලය සිවු දිශාවට අයත් වන සේ පිළිම ගෙය නිර්මාණය කරන්නට ඇතැයි සිතිය හැකිය. අඩි හතරක් පමණ පස් පුරවා උස් කරන ලද බිමක විහාරය ඉදි කොට තිබේ. වේයන්ගෙන්, වෙනත් කෘමි සතුන්ගෙන් හා විවිධ බාධකවලින් පිළිම ගෙය ආරක්ෂා කර ගැනීම සඳහා මෙසේ බිම උස් කර ගන්නට ඇත.

### 3.2.1. ගර්භ ගෘහය

ඇතුළු විහාරයට ප්‍රවේශවීමට දොරටු දෙකක් තිබේ. ඒවා සකසා ඇත්තේ ඇතුළුවීමට හා විහාරයෙන් බැහැරවීමටය. අන්තරාලයේ සිට බලන විට එක් දොරටුවකින් සැතපෙන බුද්ධ ප්‍රතිමා වහන්සේගේ ශීර්ෂය පෙනෙන ආකාරයකිනුත්, අනෙක් දොරටුව බුද්ධ ප්‍රතිමාවේ ශ්‍රීපාදය පෙනෙන ආකාරයෙනුත් ඉදිකොට තිබේ. ගර්භ ගෘහයේ ඇති සැතපෙන බුද්ධ ප්‍රතිමා වහන්සේ අඩි විස්සක් පමණ දිගින් යුක්තය. පිළිමයේ ශීර්ෂය දෙසින් හිඳි සමාධි බුද්ධ ප්‍රතිමාවකුත්, පාද දෙසින් උතුරු බිත්තියේ හිටි බුද්ධ ප්‍රතිමාවකුත් නිර්මාණය කොට ඇත. පරණ විහාරගෙයි ප්‍රතිමා පිහිටා ඇති ආකාරයෙන්ම අලුත් විහාරයේත් ප්‍රතිමා ඉදිකොට තිබේ. ගර්භ ගෘහයේ බිත්තිවල මහනුවර යුගයට අයත් සිතුවම් චිත්‍රණය කොට තිබේ. ශ්‍රාවක රූප ඇඳ ඇත්තේ දකුණු අතින් සපු මලක් දරාගෙන සිටින හා වම් අත පහළට හෙළා ඇති ආකාරයෙනි. මේ ශ්‍රාවක රූපවලින් පැරණි පිළිම ගෘහයේ ශ්‍රාවක රූප තරම් දර්ශනීය බවක් හෝ සියුම් බවක් ප්‍රදර්ශනය නොවේ. රතු වර්ණය සහ සුදු වර්ණය බහුලව භාවිත කොට තිබේ. සැතපෙන බුද්ධ ප්‍රතිමාවේ ශ්‍රී පාදය දෙසින් නිර්මාණය කොට ඇති හිටි බුද්ධ ප්‍රතිමාව පිහිටුවා ඇත්තේ රශ්මි මාලාවක් විහිද යන බදාමයෙන් කළ කුටියක් තුළයි. පැරණි විහාරයේ හිටි පිළිම වහන්සේගේ ස්වභාවය අනුකරණය කොට තිබේ. එහෙත් එක මුද්‍රාවක් වෙනස් කොට ඇත. පැරණි විහාරයේ හිටිපිළිමයේ දකුණතින් අභය මුද්‍රාව දක්වා තිබුණද මෙහි දකුණතින් දක්වා ඇත්තේ ආශීර්වාද මුද්‍රාවයි. වමතින් පිළිම දෙකේම දක්වා ඇත්තේ කටක හස්ත මුද්‍රාවයි. පිළිමයට දකුණු පසින් බුදුපිළිමයට නමස්කාර කරන අගසවු දෙනමගේ රූප සිතුවම් කොට තිබේ. සැතපෙන පිළිමයට ඉදිරිපස බිත්තියේ එනම් ප්‍රවේශ දොරටු පිහිටි බිත්තියේ ඇතුළු ගෙයි බිත්තිය තීරු පහකට බෙදා සූවිසි විවරණය, සත් සතිය, බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාද ලාංඡන පහ, මල් අතින් දරා සිටින රහතන් වහන්සේලා, පූජා භාණ්ඩ හිස මත තබා ගෙන ගමන් කරන සිවු දෙනෙකු හා සක් පිඹින්නෙක් සිතුවම් කොට තිබේ. මේ සිතුවම් අතුරින් ශ්‍රී පාද ලාංඡනය සහිත සිතුවම් පහ වෙනත් කිසිදු විහාරයකින් හමු නොවන විශේෂ සිතුවම් පෙළකි. බිත්තියේ නැගෙනහිර කෙළවර එනම් සමාධි ප්‍රතිමාව දෙසට දිවයන බිත්තියේ කෙළවර ශ්‍රාවක රූප සිතුවම් කොට ඇති අතර ඒවායේ නමස්කාරය සමාධි ප්‍රතිමාව වෙත යොමු කොට තිබේ. සමාධි බුද්ධ ප්‍රතිමාව මහනුවර යුගයේ ලක්ෂණ හොඳින් කියාපායි. විහාරයේ අනෙක් බුද්ධ ප්‍රතිමා ප්‍රතිසංස්කරණවලට ලක් වීමෙන් මුල් ස්වරූපය වෙනස්කම්වලට ලක්වී තිබේ. එහෙත් සමාධි ප්‍රතිමාව පැරණි තත්ත්වයෙන්ම පවතියි. නැගෙනහිර බිත්තියේ වම් කෙළවර ඇත්තේ මීටර් හතක් පමණ උස විශාල විෂ්ණු දේව ප්‍රතිමාවකි. දකුණු අතින් විතර්ක මුද්‍රාවද වම් අතින් වරද මුද්‍රාවද දරයි. උඩු කය, ගෙළ, දෙඅත් සහ ඉග ප්‍රදේශය ආභරණවලින් සරසා තිබේ. යටිකය දෝතියකින් සරසා තිබේ. ශීර්ෂය මකුටයකින් යුක්තය. ඇතුළු විහාරයේ වියන් මත සැරසිලි සිතුවම් දක්නට ලැබේ.

### 3.3. අන්තරාලය කොටස

පිළිම ගෙයි ප්‍රවේශ දොරටු ඇති බිත්තියේ දෙකෙළවර අඩි විස්සක් පමණ උසින් යුක්ත විශාල දොරටුපාල රූප දෙකක්ද ප්‍රවේශ දොරටුවලට ඉහළින් මකර තොරණ දෙකක්ද මූර්තිමත් කොට තිබේ. දොරටුපාල රූපවල වම් අත වැළමිට ළඟින් නවා උකුල මත තබාගෙන සිටින අතර දකුණු අතින් කඩුවක් දරා සිටියි. මකර තොරණේ ආරුක්කු මත ශිව, බ්‍රහ්ම, විෂ්ණු සහ ඉන්ද්‍ර යන දෙවිවරුන්ගේ මූර්ති රූපත්, අඳුන් දිවිසම් ඇඳගත් විද්‍යාධරයන් දෙදෙනෙකුගේ හිටි රූපත් රමණීය ලෙස මූර්තිමත් කොට තිබේ. සියලු දේවරූප වරද මුද්‍රාවෙන් හා අභය මුද්‍රාවෙන් යුක්තය. මේ මූර්ති රූපවල හිස, දෙඅත්, දෙකන්, ගෙළ, පපුව සහ ඉඟටිය ආභරණවලින් සරසා තිබේ. යටිකය රැලි සහිත දෝතියකින් සරසා තිබේ. දේව ප්‍රතිමාවලට පිටුපසින් බිත්තියේ ඔවුන්ට අයත් වාහන සිතුවමට නගා ඇත. මකර තොරණ දෙකෙහිම අලංකාරව කැපී පෙනෙන්නේ සිංහ රූපයි. වම්පස මකර තොරණේ සිංහයන් දෙදෙනා මුඛය විවෘත කරගෙන පිටුපසට හරවාගෙන සිටින ඉරියව්වෙන් නිර්මිතය. එහෙත් දකුණු තොරණේ ඇත්තේ මුඛය ඉදිරියට පාමින් සිටින අයුරින්ය. මකරාගේ වලිගය තිරිඟිතලය ඇසුරින් අලංකාර ලියවැල්වලින් සරසා තිබේ. මකර තොරණේ විහිද යන ලියවැල කිඹිසි මුහුණින් කෙළවර වේ. මකර තොරණට යට වූ ඉඩ ප්‍රමාණය හැරුණු කොට බිත්තියේ ඉතිරි හිස් අවකාශය පිරවීමට ඉර, හඳ, මල්වැල් රටා, දෙවිවරුන්ට අයත් සත්ත්ව වාහන සිතුවම් කොට තිබේ.

මකර තොරණ දෙකට මැදින් හෙවත් ප්‍රවේශ දොරටු දෙකට මැද ඇති බිත්තියේ අවකාශය යොදාගෙන නිර්මාණය කොට ඇති විශාල අනංග ප්‍රතිමාව අඩි විස්සක් පමණ උසකින් යුක්තය. ලංකාවේ මෙතෙක් පිළිම ගෙයකින් හමු නොවන එකම හා පළමු අනංග දේව ප්‍රතිමාව ලෙස හඳුනාගෙන ඇත්තේද මෙයයි. වම් අතින් උක් දණ්ඩ නමැති දුන්නත්, දකුණු අතින් මල් නමැති ඊතලත් දරාගෙන සිටියි. දුනු දිය හෙවත් දුනු වැල දක්වා ඇත්තේ බඹර වැලකින්ය. මුහුණේ මද සිනහවක් තිබේ. හිසේ කේතුකාකාර ජටා මකුටයකි. ගෙල, දෙකන්, දෙඅත්, පපුව ආදී ප්‍රදේශ ආභරණවලින් සරසා තිබේ. ශරීරයේ පහළ කොටස දෝතිය ඇඳුමකින් යුක්ත වන අතර එය රතු පාටින් වර්ණ ගන්වා තිබේ. උඩු කය නිරුවත්ය. කහ පැහැයෙන් යුක්තය. අනංගයා යනු කාමයට අධිපති දෙවියාය. විවාහයට, ප්‍රේමයට අධිපති දෙවියා ලෙසද සැලකේ. ඔහු නිවන වළක්වන කෙනෙක් ලෙස බෞද්ධ සාහිත්‍යයේ ප්‍රකටය. බුදු දහම සසර කෙටි කර ගැනීමට ධර්මය කියා දෙන අතරේ අනංග සංකල්පයෙන් පංචකාමය විඳීමට උගන්වයි. අනංගයා යනු ලෞකිකත්වය නිරූපණය කරන සංකේතයයි. එමෙන්ම කාමයට හා සශ්‍රීකත්වයට අධිපති හින්දු දෙවියයි (වික්‍රමගමගේ, 1995:27). මේ අනංග රූපය විහාරයක පැවතිය යුතු සංකල්පවලට ප්‍රතිවිරුද්ධ රූපයකි. ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශ්වයම පෘථග්ජනයන්ය; ඔවුන් ලෞකික ආශාවලින් බරිතය; අනංගයාගේ දැලට හසු වේ. එහෙත් විහාරයට පිවිසෙන විට අනංගයාට හසු නොවිය යුතුය. ඔහු පරාජයට පත් විය යුතුය. ඔහු ජය ගැනීම දුෂ්කරය. එහෙත් අනංගයා ජය ගත් කෙනා නිවන් මාර්ගයට පිවිසෙයි. නිවන් මාර්ගයේ ගමන් කළත් ගමනට බාධාවක් තිබේ. එනම් ජීවිතයට ලැබී ඇති ආයුෂයයි. ලොව උපන් පුද්ගලයන්ට ලැබුණු ආයුෂ කාලය ඉතා කෙටිය. එයද වහා මකරා ගිල දමයි. ඔහුගෙනුත් ජය ගත යුතුය. එයට කළ යුතු පිළියම වන්නේ වහා ධර්මය අවබෝධ කර ගැනීමට බුදුන් වහන්සේ දැකීමට යාමයි. ධර්මය ශ්‍රවණය කිරීමයි. ශ්‍රාවක මාර්ගයට පිවිසීමයි. ලෞකික ජීවිතයෙන් මිදී ලෝකෝත්තර මාර්ගයට පිවිසීමේ දුෂ්කරතාව හා බාධක ජය ගත යුතු බව මේ මකර තොරණ හා අනංග ප්‍රතිමාවෙන් නිරූපණය කරන්නට ඇත. විහාරයට පිවිසෙන සැහැදැවතුන් අනංගයාටත්, මකරාටත් අල්ලා ගැනීමට නොහැකි බුද්ධිමත් පිරිසක් බව ධ්වනිත කර තිබේ. විහාරගෙයි වැඩ සිටින්නේ අනංගයා පරාජය කළ, ඔහු පරාජය කරන හැටි ඉගැන්වූ, මකරා පරාජය කළ එනම් කාලය හෙවත් සංසාරය ජය ගත් බුදුන් වහන්සේය. ඒ උතුම් පුද්ගලයා හමුවීමට පිවිසිය යුත්තේ අවබෝධයෙන් හා ප්‍රඥාවෙන්ය. ඒ අවබෝධයෙන් පිළිම ගෙට ප්‍රවේශ කරවීමද මේ නිර්මාණවල පරමාර්ථය වූවා විය හැකිය. මකර තොරණ දෙකට මැදි වන සේ අනංග රූපය නිර්මාණය කිරීමෙන් නිර්මාණකරුවා මකර තොරණට නව අංගයක් එකතු කරමින් මකර තොරණින් අදහස් කළ අර්ථය තවදුරටත් තීව්‍ර කිරීමට අලුතින් හඳුන්වා දුන් නව සම්ප්‍රදායක් ලෙසද සැලකිය හැකිය. ප්‍රදේශවාසීන් අනංග දේව ප්‍රතිමාව සම්බන්ධයෙන් අදහස් දක්වමින් කියා

සිටින්නේ විවාහ ජීවිතය සාර්ථක කර ගැනීමට, පෙම්වතුන්ගේ හා පෙම්වතියන්ගේ ප්‍රේමය ආරක්ෂා කර ගැනීමට, නව ප්‍රේම සබඳතා ඇති කර ගැනීමට ආදිය වෙනුවෙන් අනංග දේව ප්‍රතිමාව ඉදිවූ බවයි. මේ දෙවියන් උදෙසා පූජා පැවැත්වීමෙන් ප්‍රේමය සම්බන්ධ අපේක්ෂාවන් සඵල වන බව ඔවුන්ගේ අදහසයි. එහෙත් මෑත කාලයේ එවැනි පූජා පැවැත්වීමක කිසිදු සාධකයක් දක්නට නැත.

විහාරයේ උතුරු බිත්තියට බද්ධ කර මතු කොට ගත් මතු බුදු වන බෝසතුන් සේ සැලකෙන නාථ බෝධිසත්ව ප්‍රතිමාවක් දක්නට ලැබේ. එය මීටර් හයක් පමණ උසකින් යුක්තය. ඒ පිළිමයේ හිස මත මකුටයකි. දෙඅත්, දෙකන්, ගෙළ සහ ඉඟ ප්‍රදේශය ආභරණවලින් සරසා තිබේ. වම් අතින් වරද මුද්‍රාවද, දකුණු අතින් විතර්ක මුද්‍රාවද දරයි. උඩුකය ආභරණවලින් සරසා ඇත. යටිකයට අලංකාරවත් දෝතියක් එකතු කර තිබේ. එය රැළිවලින් හැඩගන්වා ඇත. මේ ප්‍රතිමාව දෙපස මීටර් දෙකක් පමණ උස සිංහ රූප දෙකකි. ඒවා කලාත්මකව නිරූපිතය. සිංහ රූප දෙකට ඉහළින් චාමර හා කඩුගත් අත් ඇතිව සිටින දිව්‍ය ආරක්ෂකයන් සිවු දෙනෙක්ද දක්නට ලැබේ. මේ ප්‍රතිමාව පිහිටුවා ඇත්තේ මකර තොරණක් යටයි. මෙම මකර තොරණ ප්‍රධාන මකර තොරණ දෙක තරම් උසස් ගණයට අයත් නැත.

පිටත මාලයේ සිට අන්තරාලය ගෘහයට ප්‍රවේශවන ප්‍රධාන දොරටුව සහිත බිත්තියේ ඇතුළු පැත්තේ සිතුවම් විශාල ප්‍රමාණයක් දක්නට ලැබේ. ප්‍රධාන දොරටුවට දෙපස බිත්ති දෙකේ සැලකිය යුතු ඉඩක් ගෙන ජනෙල් දෙකක් තබා තිබේ. එම ඉඩ ප්‍රමාණය හැරුණු විට බිත්තියේ ඇතුළත ඉතිරි අවකාශය යොදා ගනිමින් අඛණ්ඩ කථන ශෛලිය භාවිත කරමින් ඉහළ සිට පහළට එන සේ වෙන් කර ගත් කොටස් මත පිළිවෙළින් සොළොස්මස්ථානය, චාතුර්මහාරාජිකය-තාවතිංසය-යාමය-තුසිතය-නිම්මාණරතිය-පරනිර්මිතය යන දිව්‍ය ලෝක හය, දහම්සොඬ ජාතක කතාවේ අවස්ථා, ඛදිරංග ජාතකයේ අවස්ථා, චුල්ල ධර්මපාල ජාතක කතාවේ අවස්ථා, වෙස්සන්තර ජාතක කතාවේ සිදුවීම් මැනවින් නිරූපණය කොට තිබේ. මේ හැම සිතුවමකම පසුතලයට රතුවන් තද දුඹුරු පැහැය, අළු පැහැය සහ කොළ වර්ණ භාවිත කර තිබේ. මෙයට අමතරව සිතුවම් වර්ණ ගැන්වීමට කහ, නිල් ආදී වර්ණත් බහුලව භාවිත කර තිබේ. සිතුවම්වල ගෘහ අභ්‍යන්තරය දැක්වීමේදී ප්‍රධාන වශයෙන් කළු වර්ණයද අළුවන් කොළ පැහැය සහ අළුවන් දම් පැහැයද භාවිත කොට ඇත. චිත්‍ර ශිල්පියා වැඩි කැමැත්තක් දක්වා ඇති වර්ණයක් ලෙස නීල වර්ණය හඳුනා ගත හැකිය. අලුත් විහාරයේ සිතුවම්වලින් වැඩි ප්‍රමාණයකට නීල වර්ණය සියුම්ව හෝ යොදාගත් ආකාරයක් දක්නට ලැබේ. බටහිරින් ගෙන්වන ලද කෘත්‍රිම වර්ණද මේ සිතුවම් සඳහා භාවිත කර ඇත. මේ විහාරගෙයි තවත් විශේෂත්වයක් වන්නේ මනුෂ්‍ය රූප සිත් ගන්නා ආකාරයෙන් නිර්මාණය කර තිබීමයි. ඔවුන්ගේ අංග චලන හා ඉරියව් තාත්ත්වික ස්වරූපයක් ගනියි. සදෙව්ලොව සිතුවම් චිත්තාකර්ෂණීය ස්වරූපයෙන් ඉදිරිපත් කර ඇත. දෙවිවරුන්ගේ ශරීර සමබරව ඇඳ තිබේ. චාතුර්මහාරාජිකය දෙව්ලොව වැඩ සිටින ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ, සහ වෛශ්‍රවණ දෙවිවරුන් මන්දිර හතරක සිටින ආකාරයෙන් සිතුවම් කොට ඇත. ඒ මාලිගා ලියවැල් හා තිරිඟිතලය වැනි මෝස්තර රටාවලින් සරසා තිබේ.

### 3.4. සමාජ, සංස්කෘතික, ආගමික වැදගත්කම

යටත් විජිත සමයේ ගොඩනැගුණු ගෘහ නිර්මාණ අංගත්, බටහිර සිතුවම් කලාවේ ලක්ෂණත්, මහනුවර යුගයේ පහත රට සිතුවම්වලට අනන්‍ය ලක්ෂණත් හඳුනා ගැනීමට මේ විහාරයේ සිතුවම් වැදගත් වේ. චුල්ල ධර්මපාල ජාතකයේ මහාප්‍රතාප රජතුමාගේ මාලිගාවේ ආලින්දයේ දක්නට ලැබෙන පුටු, කුලුණු, ආරුක්කු හා මාලිගාවේ සැලැස්ම යුරෝපීය වාස්තු විද්‍යාව ගුරු කොටගෙන සිතුවම් කොට තිබේ. වෙස්සන්තර ජාතකයේ වෙස්සන්තර රජතුමාගේ භාණ්ඩාගාර ගොඩනැගිල්ලේ වස්තුව පිරුණු පෙට්ටි, නිම්මාණරතිය දිව්‍යලෝකයේ දෙවියන් වැඩ සිටින කවිච්චිය තවත් යුරෝපීය ලක්ෂණ කිහිපයකි. මෙයට අමතරව ඛදිරංග ජාතකය, දේවධර්ම ජාතකය, ශ්‍රී

පාද ලාංඡන දැක්වෙන සිතුවම් ආදියෙහි පිත්තල පඩික්කම්, යුරෝපීය බෑග්, තරාදි, පුන්කලස්, මිනිසුන්ගේ ටයිපටි, කනප්පුව, ලීපුටු ආදිය දක්නට ලැබේ. වෙස්සන්තර ජාතකයේ සහ දිව්‍ය ලෝක සිතුවම්වල දක්නට ලැබෙන අශ්වරථ සිතුවම් කර ඇත්තේද යටත් විජිත සමයේ සමාජ පසුබිම පාදක කොට ගෙනය. අශ්වරථවල දක්නට ලැබෙන තිරරෙදි, පැති ඇන්ද, කරත්තයේ වහළය එයට සාක්ෂි සපයයි. දකුණු සම්ප්‍රදායේ දක්නට ලැබෙන තවත් විශේෂත්වයක් වන්නේ හිස් අවකාශ පිරවීමට මෝස්තර රටා භාවිත කිරීමයි. මේ විහාරයේ දක්නට ඇති හිස් අවකාශ පුරවා ඇත්තේ සපු මල, කඩුපුල් මල, ශෛලීගත නෙළුම් මල, රෝස මල, පිච්ච මල සහ ලියවැල් මෝස්තර රටා යොදාගෙනය. වෙස්සන්තර ජාතකය, ඛදිරංග ජාතකය, සදෙව්ලොව නිරූපිත මාලිගා අභ්‍යන්තරයේ, දහම්සොඬ ජාතකයේ ගෘහ අභ්‍යන්තරයේ, වෙස්සන්තර ජාතකයේ අශ්වරථය ඇතුළත, පංචනාරිඝටය සිතුවමේ සහ සත් සතිය දැක්වෙන සිතුවම්වල මේ මල් සැරසිලි දැක ගත හැකිය. හිස් අවකාශය පිරිවීමට භාවිත කළ තවත් සැරසිල්ලක් වන්නේ අතු රිකිලි සහ මල් සහිත අතු රිකිලි යොදා ගැනීමයි. සොළොස්මස්ථාන සිතුවම් අතර, නාථ දේව රූපයට බද්ධ වූ බිත්තියේ ඉඩකඩ සහිත ස්ථානවල, සූවිසිවිවරණ සිතුවම් පෙළ අතර, ඉදිරිපස මකර තොරණේ මූර්ති අතර යුරෝපීය ආභාසය පෙන්වන රිකිලි සහ මල් කිණිති සිතුවම් කර තිබේ. තවද අලුත් විහාරයේ සැතපෙන පිළිමයට ඉදිරියෙන් ඇති බිත්තියේ සිතුවම් කර ඇති ප්‍රභූ මිනිසුන්ගේ අත්වල මල් කිනිති සහ රෝස මල් දක්නට ලැබේ. හිස් අවකාශ පිරවීමට ශිල්පියා යොදා ගත් තවත් සැරසිල්ලක් වන්නේ වෘක්ෂ සිතුවම් කිරීමයි. චුල්ල ධර්මපාල ජාතකයේ මහාප්‍රතාප රජතුමාගේ මාලිගාව ඉදිරිපිට ඇති ගස මෙයට නිදසුනකි. එහි කඳ නිල්පාටින්ද ශෛලී ගත පත්‍ර දැක්වීමට රතු හා කළු පාට මිශ්‍ර කළ කහවන් කොළ පැහැයද යොදාගෙන තිබේ. මේ වෘක්ෂ සිතුවම් කිරීමේ සම්ප්‍රදාය පහතරට සිතුවම්වලට එකතු වුණු නව අංගයකි. මෙයට අමතරව වෙස්සන්තර ජාතකයේ වෙස්සන්තර රජතුමා සහ පවුලේ පිරිස වංගගිරියට පා ගමනින් යන අවස්ථාව දැක්වෙන සිතුවමේ ඇඳ ඇති ගස්වල විශේෂත්වයක් පවතියි. වෙනත් වෘක්ෂවලට වඩා මේ වෘක්ෂයේ ගසේ පොතු දැක්වීමට සිහින් කඩ ඉරි යොදාගෙන තිබේ. ශෛලීගත බවින් මිදී තාත්ත්වික ස්වරූපයක් ගෙන තිබේ. සොළොස්මස්ථාන සිතුවම් අතර පොල් ගස්ද ඇද තිබේ.

තොටගමුව අලුත් විහාරයේ මනුෂ්‍ය සිතුවම්වල වස්ත්‍ර නිර්මාණය කිරීමේදීද සුවිශේෂ අවධානයක් යොමු කර ඇත. බලන්නා ආකර්ෂණය වන අයුරින් ඇඳුම්වලට මල් මෝස්තර, වෘක්ෂ පත්‍ර, ලියවැල් මෝස්තර, මල් කිනිති, ජ්‍යාමිතික මෝස්තර, ත්‍රිකෝණ පේළි සහිත මෝස්තර, කොටුදැල් මෝස්තර, රිකිලි සහිත මල් මෝස්තර යොදා ගෙන තිබේ. මනුෂ්‍ය රූප සජීවී බවකින් තැබීමට වර්ණවල අඩු-වැඩි කිරීම්, චලන ස්වභාව සහ ඉරියව් කෙරෙහි සුවිශේෂ අවධානයක් යොමු කර ඇත. ඇඳුම්වල නැවි රේඛා කෙරෙහිද යොමු කර ඇත්තේ විශේෂ අවධානයකි. සිතුවම්වල ආකර්ෂණීය බව සහ විවිධත්වයක් ඇති කිරීමට සත්ත්ව රූපද සිතුවම් කර තිබේ. වෙස්සන්තර ජාතකයේ නගර ප්‍රදක්ෂිණාව දැක්වෙන සිතුවමේ කරත්තය ගෙන යන්නේ දැකුම්කළු අශ්වයකි. වෙස්සන්තර රජතුමාගේ දාන ශාලාව දැක්වෙන සිතුවමේ දානශාලා ගොඩනැගිල්ලේ වහලය මත ලැග සිටින කපුටන් දෙදෙනාගෙන් දාන ශාලාව කෑමවලින් පිරී ඇති බව හඟවයි. මුළුතැන්ගේ සිටින බළලාගේ රුව සිතුවම් කර ඇත්තේද මහත් සැලකිල්ලකිනි. භාණ්ඩාගාර ගොඩනැගිල්ලේ වහලය මත ලැග සිටින සැවුළාද සිතුවම් කර ඇත්තේ චිත්තාකර්ෂණීය ලෙසයි. මෙම වහළයේ තවත් ස්ථාන කිහිපයකම උකුස්සා, පරවියා, මයිනා සිතුවම් කර ඇත. ශාඛ මත ලැග සිටින වඳුරන්ද ඇද ඇත්තේ තාත්ත්වික ලෙසිනි. දහම්සොඬ ජාතක කථාවේ සිතුවම්වල ගිරව් දෙදෙනෙක්, පරවියෙක් හා පියාඹන මොනරෙක් සිතුවම් කර ඇත. පියාඹන මොනරාගේ ඉරියව් ප්‍රබල ලෙස මතු කර තිබේ. සාම ජාතකය සිතුවම් කිරීමේදී කථාවේ සෞම්‍ය ගුණයට ගැළපෙන අයුරින් මුව පැටවු, ඇතා, වඳුරා යන සතුන් චිත්‍රණය කර තිබේ.

## 4. සමාලෝචනය

තොටගමුව රජමහා විහාරයේ පිළිම ගෙවල දෙක නිරීක්ෂණය කිරීමේදී මහනුවර යුගයට අයත් මූර්ති නිර්මාණත්, එකල සිතුවම් සම්ප්‍රදායේ ලක්ෂණත් දැක ගත හැකි විය. විහාර දෙකම විවිධ අවස්ථාවල ප්‍රතිසංස්කරණවලට ලක්වී තිබේ. එබැවින් පැරණි තත්ත්වයද ඇතැම් මූර්ති නිර්මාණවලත්, සිතුවම්වලත් දක්නට නැත. බටහිර සංස්කෘතියේ බලපෑම මත සිතුවම්වලට එකතු වුණු ගෘහභාණ්ඩ, ඇඳුම් පැළඳුම්, නිවාස ආකෘති පැහැදිලිව හඳුනා ගත හැකිය. පහතරට සිතුවම් සම්ප්‍රදායේ සිතුවම් සමූහයක් මේ විහාරයේ තවමත් සුරක්ෂිතව තිබේ. චිත්‍ර ශිල්පියා වර්ණ භාවිත කිරීමේදී විදේශීය කෘත්‍රිම වර්ණද යොදා ගෙන ඇත. අලුත් විහාරය ගොඩනැගීමේදී විහාරාභ්‍යන්තරයේ ගොඩනැගෙන මූර්ති නිර්මාණ හා සිතුවම්වල පැවැත්ම කෙරෙහි සුවිශේෂ අවධානයක් යොමු කළ බව ඇතුළු ගෘහය, අන්තරාලය හා බාහිර මණ්ඩපය ලෙස කොටස් තුනකින් යුක්ත වීමෙන්ම තහවුරු වෙයි. ගොඩනැගිල්ලේ බිත්ති ඉතා උස්ව සකසා ඇත්තේ සිතුවම් ඇඳීමේ පූර්ව සැලසුමක් සහිතවයි. නිර්මාණවල පැවැත්ම කෙරෙහිත්, සැදැහැති බෞද්ධයන් කෙරෙහිත්, නිර්මාණ වැඩි වශයෙන් ඉදිරිපත් කිරීම කෙරෙහිත් අවධානය යොමු කරමින් ගොඩනැගිල්ල සැලසුම් කොට තිබේ. තොටගමුව විහාරය වඩාත් චිරප්‍රසිද්ධියක් උසුලන්නේ තොටගමුවේ රාහුල හිමියන් නිසාය. එහෙත් උන්වහන්සේගේ ජීවන චරිතය හා බැඳි කථා පුවතක් හෝ නිර්මාණවලින් මතුවන පුවතක් හෝ නිර්මාණවලට පාදක කර ගත් පුවතක් හෝ විහාරයේ දක්නට නොලැබේ. නව සම්ප්‍රදායක ආරම්භයක් ලෙස හෝ බෞද්ධ දර්ශනය වඩාත් හොඳින් ජනතාව අතරට ගෙනයාම වෙනුවෙන් හෝ නිර්මිත අනංග ප්‍රතිමාව නිසාද අලුත් විහාරයේ වටිනාකම වැඩිවී තිබේ.

## පරිශීලිත මූලාශ්‍රය


අමරතුංග, විජයසිරි. (1993). ***ශ්‍රී ලංකාවේ චිත්‍ර හා මූර්ති,*** වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.

උල්ලුවිස්හේවා, පී., (1993). ***උඩරට බිතුසිතුවම් මග,*** කොළඹ: රජයේ මුද්‍රණාලය.

කුමාරරත්න, සිරි විජය. (2005). ***දහඅටවන සියවසේ බිතුසිතුවම්,*** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

චාර්ල්ස්, එස්.පී., (2000). ***පාරම්පරික සිංහල බිතු සිතුවම්,*** කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

දිසානායක, ජේ.බී., (1988). ***සිංහල වෙහෙර විහාර,*** කොළඹ: ලේක්හවුස් මුද්‍රණාලය.

ප්‍රේමරත්න, කේ.පී., (සංස්.), (2013). ***ගිරා සංදේශය,*** කොළඹ-12: ප්‍රදීප ප්‍රකාශකයෝ.

බිනරගම, දයානන්ද. (2008). ***මහනුවර යුගයේ බෞද්ධ කලා සම්ප්‍රදාය,*** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මහින්ද හිමි, උණුවතුර බුබුලේ. (2007). ***දකුණේ විහාරවල මහනුවර සම්ප්‍රදායේ චිත්‍ර,*** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මහින්ද හිමි, උණුවතුර බුබුලේ. (2013). ***ලක්දිව බෞද්ධ චිත්‍ර කලා ඉතිහාසය,*** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රත්නායක, දර්ශන. (2009). ***මහනුවර චිත්‍ර සම්ප්‍රදාය සහ සමාජය,*** එල්ලක්කල: සුරම්‍ය ප්‍රකාශන.

විජේසේකර, නන්දදේව. (1964). ***පැරණි සිංහල බිතු සිතුවම්,*** කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

විනී විතාරණ සහ තවත් අය. (1957). ***සාහිත්‍යය,*** කොළඹ: සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.

සෝමතිලක. එම්., (2002). ***මහනුවර සම්ප්‍රදායේ බෞද්ධ බිතුසිතුවම් කලාව,*** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

## ඡායාරූප

(තොටගමුව පුරාණ රජමහා විහාරයේ ඡායාරූප ඉදිරිපත් කර ඇත්තේ 2024.03.01 දින සිදු කළ ක්ෂේත්‍ර අධ්‍යයනය ඇසුරිනි.)

**පරණ විහාරයේ සිතුවම් හා මූර්ති කිහිපයක්**














අලුත් විහාරයේ සිතුවම් හා මූර්ති කිහිපයක්









